友邦保險控股有限公司

香港中環干諾道中一號
友邦金融中心三十五樓

**AIA Group Limited**

35/F, AIA Central
1 Connaught Road Central
Hong Kong
T: (852) 2832 6166
F: (852) 2838 2005

AIA.com

# Media Release

## මිලියන් ඩොලර් වටමේසයේ ඉහළම ස්ථානය AIA හිමි කරගනියි

## AIA සමූහය ලොව සුවිශාලතම මිලියන් ඩොලර් වටමේස සාමාජිකයින් පිරිස වාර්තා කරයි

සීමාසහිත AIA සමූහය 2015 මැයි 6 වැනිදා වන විට මිලියන් ඩොලර් රවුන්ඩ් ටේබල් සාමාජිකයින් ලෙස නියෝජිතයින් 3,752 දෙනෙකුගේ හිමිකාරත්වය අත්පත් කරගනිමින්, සම්භාවනීය MDRT සාමාජිකත්ව නාමාවලියේ ඉහළම ස්ථානයට හිමිකම් කියන ජාත්‍යන්තර සමාගම බවට පත්ව ඇති බව AIA සමූහය විසින් නිකුත් කරන ලද නිවේදනයක් මගින් ප්‍රකාශ කරනු ලැබිණි.

ජීවිත රක්ෂණ සහ මූල්‍ය සේවා ව්‍යාපාර ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ප්‍රමිතිය ලෙස MDRT සාමාජිකත්වය ජාත්‍යන්තර වශයෙන් පිළිගැනෙයි. එහි සාමාජිකයින් විසින් කිසියම් මට්ටමක වාරික ප්‍රමාණයක්, කොමිස් වටිනාකමක් සහ ආදායම් ඉපැයුමක් ජනනය කිරීම මෙන්ම සුවිශේෂී වෘත්තීය දැනුමක්, දැඩි සදාචාරාත්මක පැවැත්මක් සහ සුවිශේෂී සේවාදායක සේවාවක් විදහා පෑ යුතු යැයි අපේක්ෂා කෙරෙයි.

“මේ විශිෂ්ට පිළිගැනීම ආසියාව පුරාම ඉහළම මට්ටමේ වෘත්තීය සේවාවක් සැපැයීමට අපගේ නියෝජිත බලකාය දක්වන අප්‍රතිහත කැපවීම තහවුරු කරන්නකි.” මේ පිළිබඳව අදහස් දක්වමින් AIA සමූහයේ සමූහ නියෝජිත බෙදාහැරීම් ජාලයේ ප්‍රධාන විධායක නිලධාරී පැට්රික් ටියොව් එසේ පැවැසීය. “ඉහළම ගණයේ අඛණ්ඩ පුහුණු වැඩසටහන් පෙළක් පිරිනැමීම, ඉහළම කුසලතා සහිත පිරිස් බඳවාගැනීම සහ රඳවාගැනීම මෙන්ම කාර්‍යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීම පිණිස වඩාත්ම දියුණු මෙවලම් සැපැයීම යනාදිය මගින් අපගේ නියෝජිතයින්ගේ අභිවෘද්ධිය සඳහා සහාය ලබාදීමට අප තවදුරටත් අඛණ්ඩව කටයුතු කරනවා. මේ අඛණ්ඩ උත්සාහය අපගේ නියෝජිතයන්ට සහ රක්ෂණවර හිමියන්ට ප්‍රතිලාභදායී වනවා වගේම, වෙළෙඳපොළ තුළ අපගේ ස්ථාවරය තවදුරටත් ශක්තිමත් කිරීමටත් වැදගත් වේවි.” ඔහු වැඩිදුරටත් පැවැසීය.

සිය නියෝජිත බලකායට සහාය ලබාදීමට සහ එය වර්ධනය කිරීමට AIA දරණ උත්සාහයන් යටතේ සමාගම විසින් දියත් කරන ලද 2010 ප්‍රමුඛ නියෝජිත ක්‍රමෝපායය සැලසුම නියෝජිත පුහුණු සහ සංවර්ධන කටයුතු සඳහා වැදගත් ආයෝජනයන්ට මග පෑදීය. මේ නව වැඩසටහන තවදුරටත් ව්‍යාප්ත කරමින් AIA සමාගම රක්ෂණ සහ මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ක්ෂේත්‍ර නියමුවන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා සහාය දැක්වීමට කැපවී සිටින සංගමයක් වන GAMA ජාත්‍යන්තර සංවිධානය සමඟ ක්‍රමෝපාය සහයෝගිතාවක් ඇරැඹීය. මෙම වැඩසටහන මගින් AIA නියෝජිත කණ්ඩායමට නිපුණතා පදනම් කරගත් වෘත්තීය සංවර්ධනය සහ එකිනෙකා අතර සම්බන්ධතා ගොඩනගා ගැනීමේ අවස්ථා සලසනු ලැබිණි. වර්ෂ 2014 වන විට ආසියා කලාපය පුරා විහිදී සිටි AIA නියෝජිත නියමුවන් පිරිස අතරින් තුනෙන් එකකට වැඩි පිරිසක් විසින් GAMA පුහුණුව සම්පූර්ණ කර තිබිණි.

ඒ හැරුණු විට, AIA සමාගම නියෝජිතයින්ගේ එදිනෙදා මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කරන සහ පාරිභෝගික අත්දැකීම විශාල වශයෙන් ඉහළ නංවන නව තාක්ෂණ පහසුකම් සඳහා ආයෝජනයන් ද සිදු කරයි. උදාහරණයක් ලෙස, සමූහයේ නවතම තාක්ෂණය යොදාගැනෙන iPoS මගින් i-Pad වැනි ඉලෙක්ට්‍රොනික ටැබ්ලට් ඔස්සේ ඕනෑම වේලාවක ඕනෑම තැනක සිටින රක්ෂණවර හිමියන් සමඟ සම්බන්ධවීමට ඉඩ සැලසේ. එමගින් රක්ෂණවර හිමියන් වෙත ළඟාවීමේ සහ ඔවුන් රඳවාගැනීමේ හැකියාව ඉහළ නැංවෙයි.

වර්ෂ 2015 මැයි 31 වැනිදායින් අවසන් වූ මාස හය තුළදී නව ව්‍යාපාරයන්හි වටිනාකම සම්බන්ධයෙන් සියයට 21 ක වර්ධනයක් AIA නියෝජිත ව්‍යාපාර විසින් වාර්තා කිරීම වැනි, සමූහයේ ජයග්‍රහණ මගින් කලාපය තුළ ඉහළම විශිෂ්ටත්වයෙන් යුතු නියෝජිත බලකායේ හිමිකාරත්වය පවත්වා ගැනීම සඳහා AIA විසින් දරනු ලබන කැපවීම විදහා දක්වෙයි.

AIA Group Limited is incorporated in Hong Kong with limited liability. 友邦保險控股有限公司是於香港註冊成立之有限公司。

## AIA ගැන

සීමාසහිත AIA සමූහය සහ එහි අනුබද්ධ සමාගම් (පොදුවේ "AIA" හෝ "සමූහය" ලෙස හැඳින්වෙන) සියල්ල සුවිශාලතම ස්වාධීන පොදු ලැයිස්තුගත පෙරදිග ආසියානු (පෑන් ඒෂියානු) ජීවිත රක්ෂණ සමූහයකි. එය ආසියා ශාන්තිකර කලාපය තුළ හොංකොං, තායිලන්තය, සිංගප්පූරුව, මැලේසියාව, චීනය, කොරියාව, පිලිපීනය, ඕස්ට්‍රේලියාව, ඉන්දුනීසියාව, තායිවානය, වියට්නාමය, නවසීලන්තය, මැකෝ, බෲනායි යන රටවල පූර්ණ හිමිකම් සහිත ශාඛා සහ අනුබද්ධ සමාගම් ලෙසත්, ශ්‍රී ලංකාවේ සියයට 97 ක අනුබද්ධ සමාගමක් ලෙසත්, ඉන්දියාවේ සියයට 26 ක හවුල් ව්‍යාපාරයක් ලෙසත්, මියන්මාරය සහ කාම්බෝජය යන රටවල නියෝජිත කාර්යාල ලෙසත් යනාදී වශයෙන් රටවල් 18 ක ක්‍රියාත්මකය.

මේ වන විට AIA බවට පත්ව ඇති ව්‍යාපාරය මුලින්ම ඇරඹුණේ වසර 90 කට අධික කාලයකට පෙර ෂැංහායි නගරයේදීය. එය ජීවිත රක්ෂණ වාරික ආශ්‍රිතව ආසියා ශාන්තිකර කලාපයේ (කලින් ජපානය) වෙළෙඳපොළ ප්‍රමුඛයා වන එය සිය වෙළෙඳපොළවල බහුතරයක් පුරා ප්‍රමුඛ තත්ත්වයන් හිමි කරගෙන සිටියි. වර්ෂ 2015 මැයි 31 වන විට එය ඇමෙරිකානු ඩොලර් බිලියන 172 ක සමස්ත වත්කම් ප්‍රමාණයක් එය සතුව පැවැතිණ.

AIA විසින් ජීවිත රක්ෂණය, හදිසි අනතුරු සහ සෞඛ්‍ය රක්ෂණ මෙන්ම ඉතුරුම් සැලසුම් ඇතුළු රක්ෂණාවර සහ සේවාවන් රැසක් පිරිනමමින් සැමගේ දිගු කාලීන ඉතුරුම් සහ රැකවරණ අවශ්‍යතා සපුරාලනු ලබයි. සමූහය මගින් ආයතනික සේවාදායකයින් සඳහා සේවක ප්‍රතිලාභ, ණය පහසුකම් සහිත ජීවිත සහ විශ්‍රාම සැලසුම් පිරිනමනු ලබයි. ආසියා ශාන්තිකර කලාපය පුරා ව්‍යාප්ත නියෝජිතයින්, සහකරුවන් සහ සේවකයින් ඇතුළු විවිධ පිරිස්වලින් සමන්විත සුවිශාල ජාලයක් ඔස්සේ AIA විසින් තනි පුද්ගල රක්ෂණාවර මිලියන 29කට අධික තනි පුද්ගල රක්ෂණාවර ප්‍රමාණයක් හිමි රක්ෂණාවරහිමියන් පිරිසකට සහ සමූහ රක්ෂණ සැලසුම් හා සම්බන්ධ සක්‍රිය සාමාජිකයින් මිලියන 16 කට අධික පිරිසකට සේවය සලසයි.

සීමාසහිත AIA සමූහය අත්පිට වෙළෙඳපොළේ අලෙවි වන (හැඳුනුම් සංකේතය: "AAGIY") ඇමෙරිකානු තැන්පතුකරණ ලදුපත් (1 වැනි මට්ටම) සමඟ "1299" තොග සංකේතය යටතේ සීමාසහිත හොංකොං තොග හුවමාරුවේ ප්‍රධාන මණ්ඩලයේ ලැයිස්තුගත කර ඇත.

## MDRT ගැන

වර්ෂ 1927 දී පිහිටුවන ලද මිලියන් ඩොලර් රවුන්ඩ් ටේබල් (Million Dollar Round Table - MDRT) හෙවත් මිලියන් ඩොලර් වටමේසය නමැති මූල්‍ය වෘත්තිකයින්ගේ ප්‍රමුඛ සංගමය රටවල් 71 ක සමාගම් 470 කට අධික ප්‍රමාණයක් නියෝජනය කරන ලොව ප්‍රමුඛතම ජීවිත රක්ෂණ සහ මූල්‍ය වෘත්තිකයින් 42,000 කට අධික පිරිසකගෙන් සැදුම් ලත් ජාත්‍යන්තර තලයේ ස්වාධීන සංගමයකි. MDRT සාමාජිකයින් සුවිශේෂී වෘත්තීය දැනුමක්, දැඩි සදාචාරාත්මක පැවැත්මක් සහ විශිෂ්ට සේවාදායක සේවාවක් විදහා පායි. MDRT සාමාජිකත්වය ජීවිත රක්ෂණ සහ මූල්‍ය සේවා ව්‍යාපාරයේ විශිෂ්ටතා ප්‍රමිතිය ලෙස ජාත්‍යන්තර වශයෙන් පිළිගැනෙයි.

**විමසීම්**

<u>**ප්‍රවෘත්ති මාධ්‍ය**</u>

| | | |
|---|---|---|
| Stephen Thomas | Stephen.Thomas@aia.com | +852 2832 6178 |
| Sonia Tsang | Sonia.Tsang@aia.com | +852 2832 1868 |
| Emerald Ng | Emerald.Ng@aia.com | +852 2832 4720 |

# # #